# ඔබ පැළඳ සිටින රන් ආභරණ නියම ප්‍රමිතියෙන් යුක්ත ද@

කැරට් 22 රන් ලෙස හිතා බාල රන් ආභරණ මිලදී නොගන්න

පාරිභෝගික ආරක්ෂාව සැලසීම මෙන්ම ස්වර්ණාභරණ කර්මාන්තයේ උන්නතිය උදෙසා නිසි පාලනය අප අධිකාරියේ වගකීම් බැවින් රන් ආභරණ මිලදී ගැනීමේදී පහත කරුණු 4 සැමගේ අවධානයට සහ ආරක්ෂාව සඳහා දක්වා ඇත.

01. **රන් ප්‍රමිතිය සහතික කර ප්‍රමිති මුද්‍රා තැබූ රන් ආභරණ (Hallmarked Jewellery) ඉල්ලා සිටින්න,**– මෙම ඉල්ලීම කිරීමට පාරිභෝගික ඔබ සැමට අයිතියක් ඇත.

02. **වෙළඳ ආයතනයේ සළකුණ එම ආභරණයේ මුද්‍රා තබා තිබිය යුතුය. -** මෙය ගැන පරීක්ෂා කරන්න'

03. **ආභරණයේ රන් (කැරට්) ප්‍රමිතිය, මුළු බර (ග්‍රෑම් දශම ස්ථාන දෙකකට), ආභරණයේ විස්තර සහ මිල ආදිය නිවැරදිව සහ පැහැදිලිව සඳහන් කර තිබිය යුතුය.**

04. **මෙම වෙළඳ ආයතනය අප අධිකාරියේ මෙම වර්ෂය සඳහා ලියාපදිංචි වී තිබිය යුතුය**

***<u>කැරට් 22 ප්‍රමිති මුද්‍රා තබා ඇති ආකාරය හඳුනා ගන්න'</u>***

මෙම ප්‍රමිති සහතික මුද්‍රාවක පහත සළකුණු, මුද්‍රා තැබිය හැක්කේ අධිකාරියට පමණි. මෙම මුද්‍රාවේ රාජ්‍ය වගකීම ඇත.

| | | 916 | ** |
|---|---|---|---|
| **පුන්කලස** ශ්‍රී ලංකාවේ වටිනා ලෝහ විශ්ලේෂණය කිරීමේ කාර්යාංශයේ මුද්‍රාව | **පහන** රන් ලෝහය හ÷න්වන මුද්‍රාව | ආභරණයේ රන් ප්‍රමාණය දැක්වෙන සළකුණ (කැරට් 22 සඳහා) | වගකීමේ/ නිෂ්පාදකයාගේ සළකුණ |

මෙය ඕනෑම කෙනෙකුට තැබිය හැකි මුද්‍රාවක් පමණි. වගකීම පිළිබඳව සැක සහිතය.

22 KT

වගකීම ?

---

**<u>ප්‍රමිති මුද්‍රා තැබූ ආභරණ (Hallmarked Jewellery) නිසා ඇති ප්‍රතිලාභ</u>**

<u>පාරිභෝගික ඔබට</u>

- පාරිභොගිකයින්ට මෙම ප්‍රමිති මුද්‍රා සහිත ස්වර්ණාභරණ නැවත විකිණීමේදී, මාරු කිරීමේදී හෝ උකස් කිරීමේදී ද උපරිම මිලක් ලබා ගත හැකි වීම මගින් අනවශ්‍ය ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු නොවේ.
- දැනට ඔබ භාවිතා කරන ස්වර්ණාභරණ පරීක්ෂා කිරීමේදී නියම ප්‍රමිතියට නොමැති බව තහවුරු වුවහොත් අධිකාරිය මැදිහත් වී පාරිභෝගික ඔබට සහන ලබා දීමට පියවර ගැනීම.

<u>ස්වර්ණාභරණ අලෙවි ආයතනවලට</u>

- ප්‍රමිති මුද්‍රා තැබූ ආභරණ අලෙවිකරු විසින් තම ආභරණවල තත්වය පිළිබඳ නිරන්තර පරීක්ෂාවෙන් සිටින බැවින් පාරිභෝගික විශ්වාශය ඇතිවීම සහ අලෙවි ප්‍රවර්ධනය නිරන්තරයෙන් සිදු වේ.

**<u>දැනුවත්වන්න</u>**

- **රන් ආභරණවල අඩංගු රන් කැරට් ප්‍රමාණය, ප්‍රමිති මුද්‍රා තැබීම (Jewellery Hallmarking) මගින් සහතික කළ හැකි ශ්‍රී ලංකාවේ ඇති එකම ආයතනය ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියයි.**